ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉන්දියාවේ සංචාරයක නිරත වේ

ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා ප්‍රමුඛ දූත පිරිසක් 2025 දෙසැම්බර් 17-19 දිනවල පැවති ලෝක සෞඛ්‍ය සංවිධානයේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ ගෝලීය සමුළුවට සහභාගී වීම සඳහා ඉන්දියාවේ සංචාරයක නිරත වූහ. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ ඉන්දීය රජයේ ආයුෂ් අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මෙම සමුළුව නව දිල්ලියේ භාරත් මණ්ඩපම් හි පැවැත්විණ.

2. "සමබරතාවය ප්‍රතිෂ්ඨාපනය කරමින්: නිරෝගීභාවයේ සහ සුවතාවයේ විද්‍යාව සහ පිළිවෙත" යන තේමාව යටතේ පැවති සමුළුවේ අරමුණ වූයේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම පිළිබඳ විද්‍යාත්මක අවබෝධය සහ පිළිවෙත් හරහා පුද්ගලයන් සහ පෘථිවිය සඳහා සමබරතාවය ප්‍රතිෂ්ඨාපනය කරන ගෝලීය ව්‍යාපාරයක් නිර්මාණය කිරීමයි.

3. සමුළුව අතරතුරදී වෛද්‍ය නලින්ද ජයතිස්ස මහතා අමාත්‍යවරුන්ගේ වටමේස සාකච්ඡාවට සහභාගී විය. එහිදී අදහස් දක්වමින් එතුමා ආයුර්වේද සහ සාම්ප්‍රදායික සුව ක්‍රමවේදයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දෘෂ්ටිකෝණයන් සහ අගනා සම්ප්‍රදායන් ගෙනහැර දැක්වීය.

4. සංචාරය අතරතුරදී අමාත්‍යතුමා ඉන්දීය රජයේ සෞඛ්‍ය සහ පවුල් සුබසාධන රාජ්‍ය අමාත්‍ය ශ්‍රීමති අනුප්‍රියා පටෙල් මහත්මිය සහ ඉන්දීය රජයේ ආයුෂ් අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ශ්‍රී ප්‍රතාප්‍රාඕ ගන්පට්රාඕ මහතා සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවන්හි නිරත විය. නියාමන සහයෝගීතාවයන්, පර්යේෂණ සබඳතා සහ ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම් ඇතුළු ක්‍රම හරහා සෞඛ්‍ය සේවය සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම සම්බන්ධයෙන් සහයෝගීතාවය ශක්තිමත් කිරීම පිළිබඳව සාකච්ඡාවන්ගේ අවධානය යොමු විය.

5. වැඩසටහනට සමගාමීව, අමාත්‍යතුමා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතීන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කරුණු කාරණා දැන ගැනීම සහ මනා පිළිවෙත් ගවේෂණය කිරීම සඳහා ඇපලෝ රෝහලේ සංචාරයක ද නිරත විය.

6. මෙම සංචාරය සෞඛ්‍ය සහ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම යන ක්ෂේත්‍රයන්හි සහයෝගීතාවය ශක්තිමත් කිරීමට සහ දෙරට ජනතාවගේ යහපත උදෙසා හවුල්කාරිත්වයන් ගොඩනැගීමට නව මාර්ග ගවේෂණය කිරීමට ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ පොදු කැපවීම අවධාරණය කළේය.

***

කොළඹ
*2025 දෙසැම්බර් 21*